# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2455/25 – 2025 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා – 2025.09.25**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය, අනුර කරුණාතිලක වන මම, එකී මණ්ඩලයට, මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, කොනකලගල නව පොම්පාගාරය ඉදි කිරීම සඳහා අමතර ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**අනුර කරුණාතිලක,**
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

යොමු අංකය: MUDH/WS/LA/02/558
2025 සැප්තැම්බර් මස 22 වන දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
සෙත්සිරිපාය අදියර II.
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක, 581 කොනකලගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොනකලගල ගමේ පිහිටි, කැඩැස්තර සිතියම් අංක 320668 කලාප අංකය 01 පත්‍ර අංක 1 හි කැබලි අංක 4 දරන " කින්නරපැලකුඹුර" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 0.0030 ක් (පර්චස් 1.2) වන ඉඩම් කොටස:

මායිම්

*උතුරට* - මෙම කැඩැස්තර සිතියමේ කැබලි අංක 2 සහ ජී. එන්. ප්‍රේමවර්ධන හිමිකම් කියන කින්නරපැලකුඹුර
*නැගෙනහිරට* - ඇළ (වියලි)
*දකුණට* - ඇළ (වියලි)
*බටහිර* - මෙම කැඩැස්තර සිතියමේ කැබලි අංක 3 සහ 2

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* නිවන්ති නිර්මාලිකා ජයවික්‍රම මිය,
අංක XB 4/24,
එඩ්මන්ටන් නිවාස සංකීර්ණය,
එඩ්මන්ටන් පාර,
කිරුළපන,
කොළඹ 05.

ECG 09 - 0235